## CII 06 සංවිධාන පරිපාලන සංස්කෘතිය (ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආශ්‍රිත අධ්‍යයනයක්)

රත්නායක එස්.ඩබ්. ටී. එල්., පුෂ්පකුමාර ඩී.අයි.පී., අබේරත්න යු.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ඕනෑම සංවිධානයක් තුළ එයටම ආවේණික සංස්කෘතියක් ඇත. එමගින් සහ ඒවායේ ශක්තීන් අනුව සංවිධාන සාමාජිකයන්ගේ ආකල්පයන් හා චර්යාවන් කෙරෙහි වැදගත් බලපෑමක් කරනු ලබයි. උදාහරණයක් ලෙස වර්තමානයේ හඳුන්වා දී ඇති දියුණු පරිගණක හා ඒ ආශ්‍රිත ශිල්ප ක්‍රමයන් ඇතුළු සංවිධාන පරිසරයක් මගින් එම සාමාජිකයන්ගේ ආකල්පයන් සහ චර්යාවන් විශාල ලෙස වෙනස් කොට ඇත. එමෙන් ම යම්කිසි රටක සමස්ත සංස්කෘතියෙහි සිදුවන්නා වූ විවිධ වෙනස්කම් සංවිධාන සංස්කෘතියෙහි වෙනස්කම් සිදුවීම සඳහා සෘජුවම බලපා ඇත. මෙලෙස ගොඩනැගෙන්නා වූ සංස්කෘතිය ආයතනයක කාර්යසඵලත්වය සහ පිරිමැසුම්දායී බවට ප්‍රබල බලපෑමක් සිදු කරනු ලබයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ සංවිධාන පරිපාලන සංස්කෘතිය පිළිබඳව න්‍යාය ප්‍රායෝගිකව විශ්ලේෂණය කිරීමයි. ඒ සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රමයේ ආරම්භය, විකාශනය හා කාර්යභාරය සොයා බැලීමත්, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ පරිපාලන සංස්කෘතිය විශ්ලේෂණය කිරීමද සිදු කලෙමු. සංවිධාන පරිපාලන සංස්කෘතිය වඩාත් හොඳින් ඉස්මතු වන ආයතනයක් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරාගත් අතර ගුණාත්මක දත්ත මත පදනම් වූ පර්යේෂණයක් වන මෙම අධ්‍යයනයට ප්‍රාථමික හා ද්විතීක දත්ත යොදා ගැණුනි. ප්‍රාථමික දත්ත සඳහා මුල් තැනක් ලබා දී නිරීක්ෂණ මගින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මෙහිදී ආවෘත සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය ප්‍රධාන විය. මේ ආයතනයේ තිබෙන ආයතන, මුදල්, ඉඩම්, සමාජ සුබසාධන, සැලසුම් හා සංවර්ධන යන අංශවල නිලධාරීන් 70ක් සිටි අතර ඉන් ස්ථිර සේවකයින් වන්නේ 52කි. ඉන් සසම්භාවී ක්‍රමය යටතේ නිලධාරීන් 30ක් නිරීක්ෂණයට ලක් කරන ලදී. ගුණාත්මක දත්ත විස්තරාත්මකව සිදු කරන ලදී. පරිපාලන ආයතනයක සේවකයින් පරිපාලන ක්‍රමය, එහි කාර්යභාරය පිළිබඳ සිතන්නේ කෙසේද යන්න අධ්‍යයනය කිරීමේදී නිලධාරීන්ගේ චර්යා හා ආකල්ප මේ සඳහා බලපාන බව පැහැදිලි විය. චර්යා යටතේ යහපත් හා අයහපත් චර්යා හඳුනා ගැනීමට හැකි විය. යහපත් චර්යා ලෙස ප්‍රායෝගික බව, මනා කළමනාකාරිත්වය, අකුරට වැඩ කිරීම ප්‍රධාන විය. අයහපත් චර්යා ලෙස වගකීම් පැහැර හැරීම, අල්ලස් ගැනීම, පුරුද්ද දැක්විය හැකිය. ආකල්ප ද යහපත් හා අයහපත් ලෙස වර්ග කළ හැකිවිය. යහපත් ආකල්ප ලෙස ධනාත්මක චින්තනය, සුහදශීලිත්වය ද, අයහපත් ආකල්ප ලෙස ආත්මාර්ථකාමී බව දක්නට හැකිවිය. මෙම තත්ත්වයන් ආයතනය තුළ සංවිධාන සංස්කෘතිය බිහි කිරීමට ප්‍රබල දායකත්වයක් ලබා දී ඇති බව පැහැදිලිය.

**ප්‍රමුඛපද:** පරිපාලන සංස්කෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, චර්යා හා ආකල්ප